# සිවිල් සංවිධාන ඇගයීම 2026

## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB)

ඔබේ සංවිධානය වසර ගණනාවක සිට සමාජයේ උන්නතිය වෙනුවෙන් අප්‍රමාණ කැපකිරීම් කරන ආයතනයක් ද? එසේනම් ඔබේ සේවාව ජාතික මට්ටමින් පිළිගැනීමට ලක්වීමට කාලය එළඹ ඇත.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (SLSSB) මගින් ක්‍රියාත්මක කරන මෙම විශේෂ ව්‍යාපෘතිය හරහා දිවයින පුරා විසිරී සිටින සක්‍රීය සිවිල් සංවිධාන හඳුනාගෙන, ඒවායේ දායකත්වය අගය කිරීමට අප සූදානම්.

### මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ ඇයි?

මෙම දත්ත රැස් කිරීමේ සහ ඇගයීමේ ක්‍රියාවලිය පිටුපස ඇති ප්‍රධාන අරමුණ වන්නේ වඩාත් ශක්තිමත් සහ විනිවිද භාවයකින් යුත් සමාජ ආරක්ෂණ ජාලයක් මෙරට ගොඩනැගීමයි:

- **විනිවිදභාවය සහ දායකත්වය ඇගයීම:** ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සිවිල් සංවිධානවල ව්‍යුහාත්මක පැවැත්ම සහ ඒවායින් සමාජයට සිදුවන සැබෑ දායකත්වය විද්‍යාත්මකව හඳුනා ගැනීම.
- **ප්‍රමුඛ හවුල්කරුවන් හඳුනා ගැනීම:** සමාජ ආරක්ෂණ වැඩපිළිවෙළ වඩාත් සාර්ථකව ජනතාව අතරට ගෙන යා හැකි "ප්‍රමුඛ සංවිධාන" (Key Partners) හඳුනාගෙන ඔවුන් සමඟ දීර්ඝකාලීන සබඳතා ගොඩනැගීම.
- **සංවිධාන ශක්තිමත් කිරීම:** තවමත් ආරම්භක මට්ටමේ පවතින සංවිධාන හඳුනාගෙන, ඔවුන්ට අවශ්‍ය පුහුණුව සහ දැනුවත් කිරීම් ලබා දී ඔවුන්ව ද අනාගතයේදී සාර්ථක හවුල්කරුවන් බවට පත් කිරීම.

### මෙම වැඩසටහනට එක් වීමෙන් ඔබේ සංවිධානයට ලැබෙන ප්‍රතිලාභ

- **රාජ්‍ය මට්ටමේ පිළිගැනීම:** මණ්ඩලයේ නිර්ණායක සපුරාලන සංවිධාන සඳහා රාජ්‍ය පිළිගැනීමක් සහිත විශේෂ "කාර්යය සාධන සහතිකයක්" හිමි වේ.
- **ප්‍රමුඛ හවුල්කාරිත්වය:** ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සේවාවන් සිදු කරන නිල හවුල්කරුවෙකු වීමේ අවස්ථාව.
- **ආදායම් මාර්ගයක් වීම:** මණ්ඩලයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන් සමාජගත කිරීම හරහා ඔබගේ සංවිධානයේ ආදායම ද වර්ධනය කරගත හැකි වීම.
- **ජාතික ඇගයීම:** මණ්ඩලයේ කාර්ය සාධනය සපුරාලන සංවිධාන ජාතික මට්ටමේ ඇගයීමට පාත්‍ර වීම.

## ඇගයීම් නිර්ණායක සහ ශ්‍රේණිගත කිරීම්

ඔබේ සංවිධානයේ ගුණාත්මකභාවය ලකුණු 32 ක උපරිමයකට යටත්ව ඇගයීමට ලක් කෙරේ:

**ලකුණු මට්ටම් අනුව වර්ගීකරණය:**

- **A ශ්‍රේණිය (ප්‍රමුඛ):** ලකුණු 25 - 32
- **B ශ්‍රේණිය (සතුටුදායක):** ලකුණු 16 - 24
- **C ශ්‍රේණිය (සාමාන්‍ය):** ලකුණු 08 - 16
- **D ශ්‍රේණිය (අවම):** ලකුණු 08 ට අඩු

## සහභාගී වන්නේ කෙසේද? (පියවර 3කි)

- **පියවර 01:** අපගේ නිල වෙබ් අඩවිය වන www.ssb.gov.lk වෙත පිවිසෙන්න.
- **පියවර 02:** "සිවිල් සංවිධාන ඇගයීමේ ද්වාරය" හරහා ඔබේ සංවිධානයේ මූලික තොරතුරු සහ සේවාවන් ඇතුළත් කරන්න.
- **පියවර 03:** අපගේ ඇගයීම් මණ්ඩලය මගින් දත්ත විශ්ලේෂණය කර, ඔබේ සංවිධානය හිමිකර ගන්නා "සමාජ ආරක්ෂණ ශ්‍රේණිගත කිරීම" (Grade) ඔබට දැනුම් දෙනු ඇත.

> "ඔබ කරන්නේ සේවයක් නොව, රටේ අනාගතය සුරක්ෂිත කරන මහා මෙහෙවරකි. එම මෙහෙවරට නිසි අගය ලබා ගැනීමට අදම අප සමඟ එක්වන්න."

**ශ්‍රී ලාංකීය සමාජ ආරක්ෂණ මෙහෙවරේ සැබෑ කොටස්කරුවකු වන්න!**

විමසීම්: 0761404673 - Jayalath / 0779056402 - Ayantha